# සන්නස

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW**<br>Lakshman Kodituwakku<br>02 9626 7660<br>02 9837 5055 | **WA**<br>Kapila Hemantha Balage<br>08 9456 1972 |
| **QLD**<br>Ananada Samaratunga<br>07 3372 7953 | **ACT**<br>Asoka Nimalasiri<br>0439 925 241 |
| **SA**<br>Chandta Eeriyagama | **TAS**<br>Anura Seneviratne<br>03 6327 4259 |

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**අපේ ලිපිනය**
22 Lorne Street
Lalor Vic 3075 Australia
Tel/Fax : 03 9402 5380

### සංස්කාරක සටහන

සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. සන්සේ පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි සිංහල, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.



# මීළඟ ගොදුර මහින්ද ද?

**ශ්‍රී ලාල් ප්‍රියන්ත**

## ජනාධිපති මහින්ද රාජපක්ෂ ඝාතන සැළසුමේ සුළ මුල

ශ්‍රී ලංකාවාසී දෙමළ ජනතාවගේ අති පූජනීය දිනයක් ලෙස "ආඩි අමා වාසී" දිනය සඳහන් කළ හැක. සෑම වසරකම ජූලි මාස 24 වැනිදාට යෙදෙන එම දිනයේ සිංහල අර්ථය "පූලි සඳ නැති රාත්‍රිය" යන්නය. මුස්ලිම් ජාතික බැතිමතුන්ට සෑම වසරකම "නෝම්බි" මාසයක් උදාවේ. එම කාල පරිච්ඡේදය තුළ මුස්ලිම් ජාතිකයෝ ආහාර අනුභව කිරීමෙන් තොරව ශරීරයට දුක්දීමේ ක්‍රමයක් අනුගමනය කරති.

දෙමළ හෙවත් හින්දු ජාතිකයන්ගේ "ආඩි අමා වාසී" දිනයත් එක් පැත්තකින් මුස්ලිම් ජාතිකයන්ගේ "නෝම්බි" දිනයට සමාන දිනයකි. එම දිනය තුළ හින්දු බැතිමතුන්ට උදේට ආහාර අනුභව කරන්නේ නැත. නමුත් දහවලට කෑම උයා කෙසෙල් කොළවලට බෙදා ගෙන අනුභව කරති. රාත්‍රී කාලයට "බත්" වැනි කෑම අනුභව නොකර සැහැල්ලු කෑමක් අනුභව කිරීම හින්දු බැතිමතුන්ගේ "ආඩි අමා වාසී" දිනය තුළ සිදුවන දෙයකි.

මූලික වශයෙන් සෑම වසරකම ජූලි මස 24 වැනිදාට යෙදෙන "ආඩි අමා වාසී" දිනයේ තේරුම "පියවරුන් සිහි කිරීමේ දිනය" යන්නය. එනම්, දෙමළ ජාතිකයන්ගේ පියවරුන් වියගිය පසු ඔවුන්ව සිහි කර පුද සත්කාර කිරීමේ හෙවත් පින් අනුමෝදන් කිරීමේ දිනය ලෙස මෙය නම් කෙරේ.

දෙමළ ජනතාවගේ මියගිය පියවරුන් සිහි කිරීමේ දිනය ජූලි මසට යෙදෙන අතර මියගිය මව්වරුන් සිහි කිරීමේ දිනය අප්‍රේල් මාසයට යෙදී ඇත. එම දිනයට දෙමළ බැතිමතුන් කෝවිලට ගොස් මස් පහන් පූජාකර දෙමව්පියන්ට පින් අනුමෝදන් කිරීම සාමාන්‍ය සිරිතකි.

ඊ.පී.ඩී.පී. සංවිධානයේ නායක සහ සමාජ සුබ සාධක අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතාගේ මහජන සම්බන්ධතා නිලධාරී සරවනමුත්තු මහ කණපතිපිල්ලේ මහතාත් පසුගිය ජූලි මස 24 වැනිදා වැල්ලවත්ත පුල්ලෙයාර් කෝවිලට ගියේ මියගිය සිය පියා සිහිකර පින් අනුමෝදන් කිරීමට ය.

ඔහුගේ පියා එම්. සරවනමුත්තුය. මව සිවපාක්‍යම් සරවනමුත්තු ය. මීට වසර කිහිපයකට පෙර මියගිය පියාව සිහි කිරීමේ අපේක්ෂාවෙන් ජූලි මස 24 වැනිදා අලුයම 6.00 ට පමණ මහ කණපතිපිල්ලේ මහතා සිය යතුරු පැදියෙන් වැල්ල වත්ත "බොස්වෙල් ලේන්" වල පිහිටි සිය නැගණියගේ නිවසේ සිට කෝවිල කරා ගමන් කළේය.

පනස් දෙහැවිරිදි වියේ පසු වූ කණපතිපිල්ලේ මහතා තිදරු පියෙකි. ඔහු නවාතැන් ගෙන සිටියේ සිය නැගණියගේ නිවසේය. ඇයගේ සැමියා විදේශ රටක සේවය කළ බැවින් ඇයගේ පවුලේ තනි නොතනියට කණපිතිපිල්ලේ මහතා එහි වාසය කළේය.

ඔහුගේ බිරිඳ වූ නලායිනි කණපතිපිල්ලේ සහ දරුවන් තිදෙනා වූ අබිරාමි ගජමුහන් සහ මල්නි පදිංචි වී සිටියේ කොළඹ 06, දුම්රියපොළ පාරේ අංක 8 ඒ 4/4 දරණ නිවසේ ය. නිතර දෙවේලේ දරුවන්ගේ හා බිරියගේ සුවදුක් බැලීමටද මහ කණපතිපිල්ලේ එම නිවසට යෑමට පුරුදු වී සිටියේය.

උතුරු නැගෙනහිර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කුමාර වේලි පිල්ලේ මහතාගේ මස්සිනා වූ මහ කණපතිපිල්ලේ මහතා සිය පියා සිහිකර පහන් පත්තු කර දෙවියන් යැදීමෙන් අනතුරුව යළිත් යතුරුපැදියේ නැගී සුපුරුදු පරිදි නිවස බලා එමින් සිටියේය.

එවිට වේලාව අලුයම 6.45 ට පමණ ඇත. ඔහු පසුපස යතුරුපැදියකින් හඹා ආ කොටි පිස්තෝලකරුවන් දෙදෙනෙක් කණපතිපිල්ලේ මහතාගේ ඔළුවට වෙඩි ප්‍රහාරයක් එල්ල කළේය. ඒ සමඟ ඔහුට යතුරුපැදිය පාලනය කරගත නොහැකිව බිම පෙරළිණි.

ඉන් උපරිම පල ප්‍රයෝජන නෙළා ගනිමින් තවත් කොටි සාමාජිකයෙක් සමඟ පැමිණි කොටි පිස්තෝලකරුවෙක් ඔවුන් පැමිණි යතුරුපැදියෙන් බිමට බැස බිම වැටී සිටි කණපතිපිල්ලේ මහතා ළඟටම පැමිණ තවත් වෙඩි ප්‍රහාර කිහිපයක් ඔළුවට එල්ල කර යතුරුපැදියේ නැග පළා ගියේය.

වැල්ලවත්ත අයි.වී.සී. පටුමගේ සිදුවූ මෙම වෙඩි තැබීමට කොටි උපයෝගී කරගෙන ඇත්තේ මිලි මීටර් 9 වර්ගයේ පිස්තෝලයකි. ඔවුන් පැමිණ ඇත්තේ සැහැල්ලු වර්ගයේ යතුරු පැදියකිනි. එය බොහෝදෙනා හඳුන්වන්නේ "මදුරුවා" යනුවෙනි.

මෙම යතුරුපැදි වර්ගය ධාවනය කිරීමට අවසර පත්‍ර (ලයිෂන්) හෝ හිස්වැසුම් අවශ්‍ය වන්නේ නැත. කොළඹ ක්‍රියාත්මක වී සිටින කොටි පිස්තෝලකරුවන් යුදමය උපක්‍රමයක් වශයෙන් ආරක්ෂකඅංශවල අවධානයට ලක් නොවී සිය ප්‍රහාරක ඉලක්කයන් සපුරා ගැනීම සඳහා මෙවැනි යතුරුපැදි භාවිත කිරීමට පටන් ගෙන ඇති බව මින් පැහැදිලි වේ.

මේ ආකාරයටම 2005 ජූලි මස 24 වැනිදාට යෙදී තිබුණ "ආඩි අමාවාසී" දිනයේදීත් ඊ.පී.ඩී.පී. සංවිධානයේ බාල්නඩරාජ් මහතාව කොටි පිස්තෝලකරුවන් විසින් කිරුළපනදී වෙඩි තබා මරා දැමිණි. කෘතහස්ත කලාකරුවෙකු වූ ඔහුව මරා දැමීමට පැමිණීමේදීත් කොටි උපයෝගී කරගෙන තිබුණේ සැහැල්ලු වර්ගයේ "මදුරුවා" යතුරු පැදියකි.

මේ වනවිට ඊ.පී.ඩී.පී. සංවිධානයේ සාමාජික සාමාජිකාවන් 100 ක් පමණ කොටි සංවිධානය මගින් වෙඩි තබා මරාදමා ඇත. ඉන් 15 දෙනෙක් පමණ නායක මට්ටමේ අය වෙති. මින් 46 දෙනෙක්ම මියගොස් ඇත්තේ රනිල් වික්‍රමසිංහ මහතා සහ වේළුපිල්ලේ ප්‍රභාකරන් අතර 2002 පෙබරවාරි මස 22 වැනිදා අත්සන් කරන ලද සටන් විරාම ගිවිසුමෙන් පසුවය.